ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 9 | විෂයය Subject: චිත්‍ර I | කාලය Time: පැ. 01 |
| නම / பெயர் / Name | | |

** සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.*

- **පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**



(1.) මෙය ............................................................ ආගම හා සම්බන්ධ නිර්මාණයකි.

(2.) මෙය ............................................................ ලෙස හැඳින්වේ.

(3.) විශේෂයෙන් මෙම නිර්මාණය ............................................ පැහැති වර්ණයෙන් අලංකාර කරනු ලැබේ.

(4.) මෙහි ............................................................ නම් සත්ව නිර්මාණයක් දැකගත හැක.

(5.) එම සත්ව රූප ආදිය ............................................ නම් කණුවල සාදනු ලැබේ.

- **අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර සපයන්න.**

(6.) කොරවක්ගල් කැටයම් සඳහා මහනුවර යුගයේ දී ...................................... සංකල්පය යොදා ගන්නා ලදී.

(7.) සිත්තමක දුර - ළඟ පෙන්නුම් කිරීම ...................................... යනුවෙන් හඳුන්වනු ලබයි.

(8.) ඉස්ලාමීය කලා නිර්මාණ අතර අක්ෂර භාවිතයෙන් කරන ලද නිර්මාණ .......................... ලෙස හඳුන්වයි.

(9.) යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් අතර අඩි 17 දිග ගව රුව .......................... ගුහාව තුල දක්නට ඇත.

(10.) සිංහල සැරසිලි කලාවේ මූලික අභ්‍යාසයක් වන වක දෙක හා ලියපත ඇසුරෙන් .......................... මල අඳිනු ලැබේ.

● අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(11.) වෙස් මුහුණු කර්මාන්තයේ වෙස් මුහුණු සකස් කර ගැනීමේ නිවැරදි ක්‍රියාවලිය අනුපිළිවෙළින්,

1.) අල්ලියාදු, ගණ කැපීම, කිරි හිඳවීම, ලකුණු කැපීම, පායම් පෑහීම

2.) ගණ කැපීම, පායම් පෑහීම, කිරි හිඳවීම, ලකුණු කැපීම, අල්ලියාදු, වර්ණ ගැන්වීම, දොරණ තෙල් තැවරීම

3.) පායම් පෑහීම, අල්ලියාදු, ලකුණු කැපීම, කිරි හිඳවීම, ගණ කැපීම, වර්ණ ගැන්වීම

4.) ගණ කැපීම, පායම් පෑහීම, කිරි හිඳවීම, ලකුණු කැපීම, අල්ලියාදු, වර්ණ ගැන්වීම

(12.) අනුරාධපුර යුගයට අයත් සඳකඩපහණක ඇති කැටයම් වනුයේ,

1.) අඩ නෙළුම, හංසාවලිය, සත්වාවලිය, ගිනි දැල්ල, සරල ලියවැල, සංකීර්ණ ලියවැල

2.) හංසාවලිය, සත්වාවලිය, සංකීර්ණ ලියවැල, පූර්ණ නෙළුම, ගිනි දැල්ල, සංකීර්ණ ලියවැල

3.) සත්වාවලිය, සංකීර්ණ ලියවැල, හංසාවලිය, ගිනි දැල්ල, අඩ නෙළුම, සරල ලියවැල, ගව රූපය

4.) ගිනි දැල්ල, සත්වාවලිය, සංකීර්ණ ලියවැල, හංසාවලිය, සරල ලියවැල, අඩ නෙළුම

(13.) මිහින්තලයේ කණ්ඨක චෛත්‍යයේ වාහල්කඩ අයත් වන යුගය වන්නේ,

1.) නුවර යුගය

2.) ගම්පොළ යුගය

3.) පොළොන්නරු යුගය

4.) අනුරාධපුර යුගය

(14.) දුම්බර පැදුරු කර්මාන්තයේදී යොදා ගන්නා රටාවන් වනුයේ,

1.) කුන්දිරික්කන්, අරිම්බුව, පනාව

2.) රන්වත්තේ අලංකාරය, කුන්දිරික්කන්, තිත්රටාව

3.) රන්වත්තේ අලංකාරය, තනිවැල් ඉරුව, තොරන් පෙත්ත

4.) තරු රටාව, හතරැස් රටාව, තිත් රටාව

(15.) දේවානම්පියතිස්ස, දුටුගැමුණු, වලගම්බා, මහසෙන් රජු විසින් කරවන ලද දාගැබ් නිවැරදිව දැක්වෙනුයේ,

1.) රුවන්වැලිසෑය, අභයගිරිය, ථූපාරාමය, ජේතවන

2.) ථූපාරාමය, රුවන්වැලිසෑය, අභයගිරිය, ජේතවන

3.) ජේතවන, ථූපාරාමය, අභයගිරිය, ථූපාරාමය

4.) අභයගිරිය, ජේතවන, රුවන්වැලිසෑය, ථූපාරාමය

● අංක 16 සිට 20 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

(16.) මස්පිඳය - ..................................................................................................................................

(17.) නිර්ජීවී - ..................................................................................................................................

(18.) ලෝලහස්ත - ..............................................................................................................................

(19.) අල්තාරය - ...............................................................................................................................

(20.) ත්‍රිමාණ - ...............................................................................................................................

● අංක 21 සිට 25 තෙක් දී ඇති රූපවලට වඩාත් සෘජු සබඳතාවක් දක්වන රූප සටහන ඒ ඉදිරියේ ඇති A, B, C, D, E යන රූප සටහන් අතුරෙන් තෝරා එහි අක්ෂරය තිත් ඉර මත යොදන්න.

(21.)  ( ................ ) A 

(22.)  ( ................ ) B 

(23.)  ( ................ ) C 

(24.)  ( ................ ) D 

(25.)  ( ................ ) E 

**● අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවල දී ඇති වැකිවල හිස්තැනට සුදුසු වචනය යොදා හිස්තැන් පුරවන්න.**

(26.) ශ්‍රී ලංකාවේ ඉපැරණි කලා කර්මාන්ත වල දී දැවමය භාණ්ඩ වල මතු පිට අලංකාර කිරීමට පමණක් ........................................................................................ යොදා ගනී.

(27.) පිළිමතලාව ප්‍රදේශය ලංකාවේ ............................................................ කර්මාන්තය සඳහා වඩාත් ම ප්‍රචලිත වී ඇත.

(28.) පුටුවක හිඳ සිටින ආකාරයේ ඉරියව්වකින් යුත් ..................................... ආසන ක්‍රමය හින්දු ආගමික නිර්මාණවල දැකගත හැක.

(29.) ශෛලිගත නාට්‍යයක ඒ ඒ චරිතයට අදාළ භූමිකාවේ ගතිලක්ෂණ ඉස්මතු කිරීමට රැවුල්, කොණ්ඩා ආදිය ඇලවීම ................................................................ වශයෙන් හැඳින්වේ.

(30. මූලික වර්ණ දෙකක් එක් වීමෙන් සෑදෙන වර්ණ ............................................................................................ නම් වේ.

- ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්නවලට F,G,H,I,J යනරූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.



F



G



H



I



J

(31.) F අක්ෂරයෙන් දැක්වෙනුයේ කුමන හැඩයේ දාගැබක් ද? ..........................................................................................

(32.) G අක්ෂරයෙන් දැක්වෙනුයේ කුමන ආසන වර්ගයක් ද? ..........................................................................................

(33.) H අක්ෂරයෙන් දැක්වෙන මුද්‍රාව කුමක්ද ? ..........................................................................................

(34.) I අක්ෂරයෙන් දැක්වෙන උද්භිද ගනයේ පුෂ්පය කුමක්ද? ..........................................................................................

(35.) J අක්ෂර නිර්මාණය හඳුන්වන නම කුමක් ද? ..........................................................................................

- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 36 සිට 40 දක්වා උප මාතෘකාවලට නිවැරදි අර්ථවත් වාක්‍යය බැගින් ලියන්න.





(36.) හඳුනාගත් බව - ..........................................................................................

(37.) ස්ථානය - ..........................................................................................

(38.) මාධ්‍යය - ..........................................................................................

(39.) ශිල්ප ක්‍රමය - ..........................................................................................

(40.) වෙනත් නම් - ..........................................................................................

( ලකුණු 40 )